
# වෙස් පෙරළෙන ලෝකේ පිරිමින්ටත් ගිලින පෙති

රත්න පතිරණ

**“උපත් පාලන පෙති” කියපු හැටියෙ එය කාන්තාවන්ට යොමුවෙච්ච පවුල් සැලසුම් ගිලින පෙති විශේෂයක් කියල හිතපු කාලෙටත් නැවතුම් තිත තියන්න වෙන කාලෙ ළගා වෙනව කියල ආරංචියි. පර්යේෂකයන් වඩා විශ්වාසනීය උපත් පාලන ගිලින පෙත්තක් පිරිමින් සඳහා සුදුනම් කර අවසානයි. කාන්තාවන් මේ නව වෙනස සඳහා සුදුනම්ද ?**



දැන් අප ගතකරන කාලය ලිංගික විප්ලවයේ දෙවන කොටසෙ ආරම්භක යුගයයි කිවොත් වඩා නිවැරදියි. ඔස්ට්‍රේලියාවේ සිදුකරන ලද මේ පර්යේෂණයට පිරිමින් 55 දෙනෙකු යොද ගත්තා. ඔවුනට මෙම නව පෙති වර්ගය භාවිත කිරීමට දී වසරක් පුරා උපත් ඵල සරු කාන්තාවන් සමග සම්බන්ධතා පැවැත්වීමට දෙනු ලැබුවා. එකදු කාන්තාවක් හෝ ගර්භනී වූවේ නැහැ. මෙම ව්‍යාපෘතිය භාරව කටයුතු කළ උපත් සම්බන්ධ සෞඛ්‍ය විශේෂඥයෙකු වන ඩේවිඩ් හැන්ඩ්ල්ස්මන් පවසන්නේ සැලකිය යුතු තරම් අතුරු ආබාධද මින් හට නොගත් බවයි. එච්චර විතරක් නෙවේ සමහර මිනිසුන් මහා මුදල් සම්භාරයක් වැය කර ලබාගන්න ලිංගික ශක්තිය වර්ධනයත් මේ සමග සුළු වශයෙන් හෝ වැඩිවීම ඔවුනට නොමිලේම ලැබුණු අතුරු ත්‍යාගයක් වගෙයි.

“ඇත්තටම අප වඩා විශ්වාසදායි මෙන්ම අවශ්‍ය වූ කලෙක යළිත් වෙනස් කළ හැකි පිරිමින් සඳහා යෝග්‍ය උපත් පාලන ක්‍රමයක් සොයා ගෙන අවසානයි” ඔහු පවසනවා.

ඇත්ත වශයෙන්ම නම් මෙවැනි උපත් පාලන පෙත්තක් වෙළෙඳ පොළට හඳුන්වා දීමට නම් අවම වශයෙන් තව වසර පහක් හෝ සමහරවිට ඊට වඩා ගතවිය හැකියි. ඒ සඳහා තවත් පර්යේෂණ ගණනාවක් පැවැත්වීමට සිදුවේ. එහෙත් මෙය විප්ලවීය වෙනසක් ලෙස සැලකිය හැක්කේ මෙම පරීක්ෂණ සඳහා මේ මොහොත වන විටත් බෙහෙත් පෙති නිෂ්පාදනය කරන සමාගම් එම වැය දැරීම සඳහා සූදානම්ව මෙම පර්යේෂණයන්ට අවශ්‍ය ආයෝජනයන් සිදුකරන බැවිනි.

ඔවුන් ඒ විශාල ප්‍රතිපාදනයන් ආයෝජනය කරමින් සිටින්නේ මිනිසුන්ට බොහෝ විට හිරිහැර සිදුකරන උපත් පාලන කොපු සහ වාසෙක්ටමි ශල්‍යකර්ම වැනි උපත් පාලන ක්‍රමයන්ට පරිබාහිරව යමක් අවශ්‍යව ඇති බව ඔවුන් හොඳකාරවම දන්නා බැවිනි.

දැනට මතුවිය හැකි ගැටළු වන්නේ මිනිසුන්ට මෙය වගකීම් සහගතව භාවිත කළ හැකිද යන්න සහ කාන්තාවන් මිනිසුන්ගේ පෙති භාවිතය සම්බන්ධව විශ්වාසය තබාවිද යන්නයි. ඒ කෙසේ වෙතත් විද්‍යාඥයින් නම් මේ තෝරාගැනීම ලබා දීම සඳහා ඉතා දැඩි මහන්සියෙන් කටයුතු කරනු පෙනෙනවා.

**එහෙත් මෙය විප්ලවීය වෙනසක් ලෙස සැලකිය හැක්කේ මෙම පරීක්ෂණ සඳහා මේ මොහොත වන විටත් බෙහෙත් පෙති නිෂ්පාදනය කරන සමාගම් එම වැය දැරීම සඳහා සුදානම්ව මෙම පර්යේෂණයන්ට අවශ්‍ය ආයෝජනයන් සිදුකරන බැවිනි. ඔවුන් ඒ විශාල ප්‍රතිපාදනයන් ආයෝජනය කරමින් සිටින්නේ මිනිසුන්ට බොහෝ විට හිරිහැර සිදුකරන උපත් පාලන කොපු සහ වාසෙක්ටමි ශල්‍යකර්ම වැනි උපත් පාලන ක්‍රමයන්ට පරිබාහිරව යමක් අවශ්‍යව ඇති බව ඔවුන් හොඳකොරවම දන්නා බැවිනි.**

ස්ත්‍රී ගර්භ බීජයන් වන ඩිම්බ නිකුත්වීම සිදුවන්නේ මාසිකව එක් වරක් පමණක් මුත් මිනිසුන්ගේ ශුක්‍ර ධාතු දස ලක්ෂ සංඛ්‍යාවක් දිනපතාම නිෂ්පාදනය වේ. පිරිමින් සඳහා " උපත් පාලන ගිලින පෙත්තක්" නිර්මාණය කරන්නෙකු මුහුණ දෙන දැවැන්ත අභියෝගයකි එය. කාන්තාවන් සඳහා නිෂ්පාදනය කරන උපත් පාලන ගිලින පෙත්තක් නම් එය ගත් මොහොතේ සිටම වාගේ ක්‍රියාත්මක වීම ආරම්භවේ.

එහෙත් පිරිමින්ගේ උපත් පාලන ගිලින පෙත්තක් ක්‍රියාත්මක තත්වයට පත්වීම ආරම්භවීමටත් එය අත්හල පසු එම ක්‍රියාකාරිත්වය යළි ප්‍රකෘති තත්වයට පත්වීමටත් ඊට වඩා බොහෝ කලක් ගතවේ. හැන්ඩ්ල්ස්මන්ගේ පර්යේෂණ අනුව ඒ සඳහා මාස තුනක් පමණ ගතවී ඇත. හැන්ඩ්ල්ස්මන් සහ පර්යේෂකයන් භාවිත කළේ හෝමෝන මගින් ප්‍රජනන ක්‍රියාකාරිත්වය වැළැක්වීමේ ඖෂධ භාවිතයයි. එමගින් ශුක්‍රාණු නිෂ්පාදනය වැළැක්වීමට පියවර ගන්නා ලදී. එහෙත් ඒ සමග ටෙස්ටොස්ටෙරොන් නිෂ්පාදනයද අඩු වීමට ගැනීම ගැටළුකාරී තත්ත්වයක් විය. එනම් එහිදී ලිංගික උත්තදුව අඩුවීම සහ ලිංගික ක්‍රියාකාරිත්වයේ දෝෂ සහිත භාවයන් ආදී ගැටළු මතුවන්නට විය. ඒ අනුව මෑත කාලයේ කරන ලද පර්යේෂණයන්හිදී ඔවුනට අමතර වශයෙන් ටෙස්ටොස්ටෙරොන් සපයනු ලැබීය. Journal of Clinical Endocrinology & Metabolism ඔක්තෝම්බර් කලාපයේ පළවී ඇති පරිදි ඔස්ට්‍රේලියාවේදී සෑම මාස තුනකට වරක්ම පිරිමිනට මෙමම ධාතු ශක්තිය හීන කරන Progestin නම් හෝමෝනය විදිනු ලැබු අතර සෑම මාස හතරකට වරක්ම ඔවුනගේ උදරයේ සම යට තැන්පත් කිරීම සිදු කරන ලදී.

සම යට තැන්පත් කිරීම් ? බෙහෙත් විදීම් ! ඔව් මේ නව්‍ය උපත් පාලන ක්‍රම අතරින් මිනිසුන්ගේ වැඩි කැමැත්ත ඇත්තේ ගිලින පෙති වලට බවයි. සමීක්ෂණ නම් හෙළිදරව් කරල තියෙන්නෙ. ඒත් අමතක කරන්න එපා බෙහෙත් විදීම් සහ සම අභ්‍යන්තරයෙහි තැන්පත් කිරීම් වැනි ක්‍රමෝපායන් ගිලින පෙති වලට වඩා සුරක්ෂිත බව.

බොහෝ කාන්තාවන්ට පෙති ගැනීම මතකයේ තබාගෙන සිටීම මහත් ගැටළුවකි. දන්නවනෙ "ආතේ" කිව්වට වැඩක් නෑ කියල. "අපි කාන්තාවන්ට අලුතින් උපත් පාලන ක්‍රමයක් හොයාගන්නවනම් මං දැන්ම තියා කියන්නම් ඒක නවත් ගිලින පෙත්තක් නම් වෙන්නෙ නෑ. හැන්ඩිල්ස්මන් පවසයි. එමෙන්ම අලුතින් ගනු ලබන ටෙස්ටොස්ටෙරොන් හේතු කොට ගෙන පුරඃස්ථි ග්‍රන්ථය ආශ්‍රිතව ආබාධකාරීත්වයත් මතුවිය හැකිද යන්න පිළිබඳ සොයා බැලීම සඳහා තව දුරටත් පර්යේෂණ සිදු කළ යුතු වෙනවා. ප්‍රධාන කොටම පුරුෂයින් සම්බන්ධ ප්‍රතිකාර ක්‍රමයන්හි ප්‍රධාන ලක්ෂණය වන්නේ හැකිතාක් අවම වශයෙන් වෛද්‍යවරයෙකු කරා යාමත් බෙහෙත් විදීම් ආදිය ඇතුළත් නොවීමත්ය. "පිරිමින් සම්බන්ධ වැඩ කටයුතු වලදී ඉදිකටු, සිරින්ජර් කියන්නෙ අන්තිමට පෙන්නන්න ඕන දේවල් " සූසාන් බෙනොෆ් නම් නිව්යෝක් සරසවියේ සිට බෙහෙත් විදීම් වලින් තොර නව සොයාගැනීමක් සම්බන්ධ පර්යේෂණයක නියලී සිටින වෛද්‍යවරයා පවසයි.

මිනිසුන් යමකට පෙළඹෙන ආකාරය ඒ වගේම ඔවුනගෙ දුබලකම් වැනි කාරණා රාශියක් නිසා මෙතරම් දිගු කාලයක් මිනිසුන් සඳහා උපත් පාලන ගිලින පෙත්තක් නිර්මාණය කිරීම සඳහා ගතවී තිබෙනවා. 1930 ගණන්වල සිටම විද්‍යාඥයන් විසින් වැඩිපුර සපයනු ලබන ටෙස්ටොස්ටෙරොන් හේතු කොට ගෙන ශුක්‍රාණු නිෂ්පාදනය අඩු කරන බව දැනගෙන සිටිනවා. ඒ විතරක් නෙවි 70 ගණන්වල සිටම පිරිමින්ට ගිලින පෙත්තක් නිර්මාණය කිරීම සඳහා පරීක්ෂණ පැවැත්වීම අරඹා තියෙනවා. "ඇත්තම කියනව නම්" හැන්ඩිල්ස්මන් පවසන පරිදි " මෙවැනි පෙත්තක් සොයාගන්න තිබුනෙ 60 ගණන් වලදියි" එසේ වුවත් ඉල්ලුම පිළිබඳ පැවති සැක සංකා ආදිය මත විද්‍යාත්මකව එවන් නිෂ්පාදනයක් කල එළි දැක්කේ නැහැ.

ඒ සඳහා එද බලපෑ මෙන්ම අදත් පවතින විශ්වාසය නම් මිනිසුන් තම උපත් එලදායිතාව උත්පාදන සශ්‍රීකත්වය පාලනය කිරීමට උනන්දු නොවන බවයි. මිනිසුන් තුළ ඕනෑම කාල වකවානුවකදී පවතින තම වැඩ කටයුතු කෙරෙහි එතරම් සැලකිල්ලක් දක්වන ස්වභාවයක් නොපිහිටීමේ ගති ලක්ෂණය මේ තත්ත්වය කෙරෙහි බලපා ඇති බව ඔස්ට්‍රේලියාවේ පැවැත්වූ මෙමම පර්යේෂණය සම්බන්ධ කථාන්තර සටහනක් පළකළ (London Guardian මතයයි. මේ සඳහා ලෝකය පුරා විශාල ඉල්ලුමක් ඇතිවෙතැයි අපේක්ෂා කෙරෙනවා. දැනටමත් සිදුකෙරෙන අත්හද බැලීම් සඳහා යුරෝපයේ ප්‍රධාන ඖෂධ නිෂ්පාදන සමාගම් දෙකක් අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙනවා.

"මං හිතන්නෙ අපි මෙච්චර කාලයක් පිරිමින්ට පුංචි අසාධාරණයක් කරල තියෙන්නෙ කියලයි." මෙම ව්‍යාපෘතිය භාර උප ප්‍රධානියා වන මිර්ජැම් මොල්ගේ අදහසයි. අප පර්යේෂණයට දායක වුනු පිරිමින් මේ පිළිබඳ දැඩි උනන්දුවකින් කටයුතු කරනවා. " ඇත්තටම කාන්තාවො ඔවුන් බෙහෙත් ගැනීම ගැන විශ්වාසය තබා විද ? ජාත්‍යන්තර උපත් පර්යේෂණ ආයතනයේ විශේෂඥයෙකු වන රෙජිත් සිට්රක් - වෙයාර් විමසනව. " සිහි මොළේ තියෙන මිනිසුන්ට හොඳට ස්ථිර සම්බන්ධතාවක් මෙමගින් පවත්වාගෙන යන්න පුළුවන් වෙනවා.

ඉතින් අපි අදහස් දක්වන අනිත් අයගෙනුත් අහල බලමුකො. ක්වෙන්ටින් බ්‍රවුන් 45 හැවිරිදි කොන්ත්‍රාත්කරුවෙක්. හේ ලොස් ඇන්ජලීස්වල පැවැත්වූ එවන් පරීක්ෂණ සඳහා සහභාගිවූවෙක්. ඔහු මේ ආරංචිය ගැන කියන්නෙ මෙහෙම "ඔබ මේ ගැන මාත් එක්ක හැදූන වැඩුන අයගෙන් අහල බලන්නකො.

එහෙමත් නැත්නම් මාත් එක්ක ගනුදෙනු කරන අයගෙන් අහල බලමු මොකද කියන්නෙ කියල. මේ අවස්ථාව ඔවුන් නම් පැනල බාරගන්නෙ" ඔහු පවසනව. ඇත්තටම පසුගිය වසර කිහිපය පුරාම බ්‍රවුන් ඔහුගෙ දකුණු කලව ආශ්‍රිත මස් ගොබය තුළ මෙමම ඖෂධ තැන්පත් කරගෙන හිටියෙ. ඔහුට නම් කිසිම ප්‍රශ්නයක් මතුවෙලත් නෑ. කව්රුවත් ගැබ් අරගෙනත් නෑ. " මට පුතෙක් ඉන්නවා" ඒ වගෙම බෑනල දෙන්නෙකුත් ඉන්නවා. මම හිතනව තව අවුරුදු හතරකින් පහකින් මේක ඔවුන්ට තෝරගන්න හොඳ අවස්ථාවක් කියල. උපත් පාලන කොපුවක් පැළඳ ගන්න වුනත් කාටද දෙයියනේ කියන්න පුළුවන් කව්රු හරි " මට දරුවෙක් ලැබෙන්න ඉන්නව. ඒ ඔයාගෙ කියල" නොකියයි කියල.

Time ඇසුරෙනි

❑

පුරුෂයින් සම්බන්ධ ප්‍රතිකාර ක්‍රමයන්හි ප්‍රධාන ලක්ෂණය වන්නේ හැකිතාක් අවම වශයෙන් වෛද්‍යවරයෙකු කරා යාමත් බෙහෙත් විදීම් ආදිය ඇතුළත් නොවීමත්ය. "පිරිමින් සම්බන්ධ වැඩ කටයුතු වලදී ඉදිකටු,, සිරින්ජර් කියන්නෙ අන්තිමට පෙන්නන්න ඕන දේවල් " සූසාන් බෙනොෆ් නම් නිව්යෝක් සරසවියේ සිට බෙහෙත් විදීම් වලින් තොර නව සොයාගැනීමක් සම්බන්ධ පර්යේෂණයක නියලී සිටින වෛද්‍යවරයා පවසයි. මිනිසුන් යමකට පෙළඹෙන ආකාරය ඒ වගේම ඔවුනගෙ දුබලකම් වැනි කාරණා රාශියක් නිසා මෙතරම් දිගු කාලයක් මිනිසුන් සඳහා උපත් පාලන ගිලින පෙත්තක් නිර්මාණය කිරීම සඳහා ගතවී තිබෙනවා